
# එතෙර මෙතෙර ගොවි විත්ති

## බරබාගෙට මහ ඉහළින් සැළකිලි



ගමේ ගොඩේ ජනතාවට බරබාගෙන් ඉටු කෙරෙන සේවය මෙතෙකැයි කියන්නට අමාරුයි. මේ හේතුව නිසා මෑතක ඉඳලා බොහොම ඉහළින් ඒ කියන්නෙ ආහාර හා කෘෂිකර්ම සංවිධානය වගේ සංවිධානවලිනුත්, බරබාගේ ගැන සැලකිලිමත් වන්න පටන් ගෙන.

අපේ රටේත් රබර් පර්යේෂණ ආයතනය බරබාගේ රෝදවල ආයුෂ දිගු කරන්නට මං සෙවුවා, 'ටයර්' එකක් දමන්නට. හැබැයි මේ ටයර් එකට හුලං ගහන්නෙ නැහැ. ඒක ඉබේම පැස්සෙන එකක්. (වොල්කනයිස් වෙනවා.) මේ ආයතනයේ විද්‍යාඥයෝ රබර් ටයර් හදන්නට ගන්න වට්ටෝරුව වගේ රසායනික ද්‍රව්‍ය රබර්වලට එකතු කරලා මේ සංයෝගය හදන්නෙ. ඒක ඕනෑම රබර් හදන ෆැක්ටරියක හදන්නට පුළුවන්ලු. ඊට පස්සේ මේ රබර් සංයෝගය දිග පටි වශයෙන් අර ගෙන සාමාන්‍ය බරබාගෙට දමන ලී රෝද වටේ එක පිළිවෙළකට ඔතනවා. ඊට පස්සේ අව්වේ දවසක් යන කොට අර 'වොල්කනයිස්' වෙන එක ඉබේම සිද්ද වෙලා. දූන් වැස්සට අහු උනාට, මඩ වගුරෙ ගියාට ගරාදි ඔස්සේ වතුර ගිහිල්ල රෝදය දිරන්නෙ නැහැ. යකඩ පට්ටම එහෙම පිටින් ම වගේ ආරක්ෂා වෙනවා. හැබැයි, ඒ රබර් පටි අවුරුදු දෙකකට වරක් අළුත් කරන්න ඕනෑ. මේ විදිහට රෝද දෙකට ම 'ටයර්' දෙකක් හයි කරන්න වැය වන්නේ රු. 130.00 ක තරම මුදලක් විතරයි.


මේ රබර් සංයෝග වට්ටෝරුව රත්මලානේ, තලවිල පාරේ, රබර් පර්යේෂණායතනයෙන් ඔබට ලබා ගත හැකි යි.

## වළගම්බාහු ව්‍යාපාරය.

වළගම්බාහු කියන කොට ලක්වැසියන් වන අපට එක විටම මතක් වන්නේ වළගම්බාහු රජතුමා ගේ වීරෝධාර කථා පුවත යි.

නමුත් මේ කථාව සුළු වාරි මාර්ග ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ එකක්. මෙය වියළි කලාපයේ අර්ධ-ජල සම්පාදිත කුඹුරු ඉඩම් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මහඉලුප්පල්ලම පර්යේෂණායතනය මගින් කර ගෙන යන පර්යේෂණයකි. එය සිදු කරන්නේ වලගම්බාහු ගමේ වෙල්යායෙහි ය.

අප මෙතෙක් කල් සැලකිල්ල යොමු කර තිබුනේ තනි බෝග නිෂ්පාදනයට අවශ්‍ය ශිල්පීය ක්‍රම කෙරෙහි පමණ යි. මෙම පර්යේෂණ යෝජනා ක්‍රමයෙන් කරන්නේ සියළු ම සම්පත් එකට එක් කර (ඉඩම්, ජලය යනාදිය) ඒවා සම්පූර්ණ වශයෙන් ප්‍රයෝජනයට යොදා ගැනීම යි.



'කුයිනෝ' ධාන්‍ය


වලගම්බාහු ගංගම් වෙල්යාය් දැනට තිබෙන බෝග වගා ක්‍රමයෙහි කැපී පෙනෙන වරද නම් මහ කන්නයේ සහ යල කන්නයේ මුලින් ම ලැබෙන වැසි ජලය ගොවීන් පාවිච්චියට නොගැනීම යි. ඒ නිසා මේ ව්‍යාපාරයෙහි සැලසුම් කර ඇති බෝග **වගා රටාව** අනුව එම ජලය අපතේ යෑම වලක්වා වර්ෂා සහ වැව් ජලය පාවිච්චිය ඒකාබද්ධ කර දැනට දෙසැම්බර් සහ මාර්තු දක්වා මාස හතරේ වගා කාලය ඔක්තෝබර් සිට ජූනි දක්වා මාස නවයක වගා කාලයයට දීර්ඝ කිරීම මෙහි බලාපොරොත්තුව යි. මෙම බෝග වගා රටාවට වී පමණක් නොවෙයි, සෝයා බෝංචි, ඉදල් ඉරිඟු, පිපිඤ්ඤා, සන්හෙම්ප්, ඇම්. අයි. 4, බූෂිටාවෝ යන බෝගත් ඇතුලත් වෙනවා.

තවද, මේ ක්‍රමය පුළුල් කිරීමෙන් මහවැලි ගඟ ව්‍යාපාරය හැරවීමෙන් හෝ භූගත ජලය මගින් වැඩි ජල ප්‍රමාණයක් සැපයීමට පහසුකම් නොමැති සුළු වැව් මගින් අර්ධ-කාලීන ජල සම්පාදනය කරන කුඹුරු අක්කර 250,000 කට ප්‍රයෝජනයක් අත් වෙනවා ඇත.

## අන්දිස් කඳුකරයේ 'ඉන්කා' වරුන් ගේ කුයිනෝ ධාන්‍ය.

මුලින් ම ලෝකයට 'අර්තාපල්' සහ 'තිරිඟු' හඳුන්වා දුන්නේ, [illegible] ඇමරිකාව අන්දිස් කඳුකරයේ ගොවීන්. ඒ වගේ ම මෙතෙක් බාහිර ලෝකය නොදත් තවත් භෝග ගණනාවක් මේ ප්‍රදේශයේ වගා කෙරෙනවා. ඒවා බොහොමයක් ගැන පර්යේෂකයින් ගේ අවධානය තවම යොමු වී නැහැ. මෙයින් එක බෝගයක් නම් 'කුයිනෝ' ධාන්‍යය ය. මේ ධාන්‍ය වර්ගය 'චෙනාපොඩ්' පවුලට අයත්. පැලෑටි ලෝකයේ මෙතෙක් සොයා ගෙන ඇති ඉතාම පෝෂ්‍යදායී ධාන්‍ය එය බව විද්‍යාඥයින් ගේ විශ්වාසය යි.

අද 'අනුරාධපුර යුගය' නැතිනම් ' පාළොන්නරු



ඇමරිකානු ගොවිපලක කපු නෙලන යන්ත්‍ර



'ටෙක්සෙල් 'බැටළුවෝ

යුගය' වගේ සභ්‍යත්වයක් අන්දීස් වැසියන් ගේ 'ඉන්කා' සභ්‍යත්වය. ඉතින් අන්දීස් වැසියෝ 'ඉන්කා' සභ්‍යත්වය වත් පෙර කාලේ ඉඳලා මේ 'කුයිනෝ' ධාන්‍ය වගා කර ගෙන එනවා. දැනට බොලිවියානු රටේ පමණක් සුළු ගොවීන් 1,20,000 ක් පමණ පිරිසක් වසරකට මෙම ධාන්‍ය ටොන් 12,000 ක් පමණ නිෂ්පාදනය කරනවා. ආහාර ආනයනයට වැය වන අධික වියදම හා රටේ මන්දපෝෂණය මැඩලීමට කටයුතු කරන බොලිවියානු රජය දැන් බේකරිවල හදන 'පාන්' ආදී හැම දෙයක ම තිරිඟු පිටිවලට සියයට පහක් 'කුයිනෝ' පිටි යොදා ගත යුතුබව නීති පමුණුවලා තියෙනවා.

## රටේ උවමනාවන්ට ඔබින අන්දමට බෝකරගත් 'ටෙක්සෙල්' බැටළුවෝ

ටෙක්සෙල් වර්ගය බෝ කලේ උතුරු මුහුදේ ඕලන්දය අසල ප්‍රීෂන් දූපත් පහෙන් එකක් වූ ටෙක්සෙල් දිවයිනේ. එය අක්කර 44,640 ක් පමණ වූ කුඩා දූපතක්. කාලාන්තරයක් තිස්සේ මේ දූපතේ දේශීය බැටළුවන් ආරක්ෂා කර ගන්න විදේශීය වර්ග ගෙනෙන්මත් තහනම් කරල තිබුණා.

ටෙක්සෙල් වර්ගයට පදනම වූයේ කලින් ඕලන්දය ගෙන වුත් දෙමුහුන් කළ බ්‍රිතාන්‍ය බැටළු වර්ග වලින් තෝරා ගත් බැටළුවනු යි. දැන් මේ ටෙක්සෙල් වර්ගය පරිසරයට ගතා ලෙස හැඩ ගැසීම, ශක්තිමත් භාවය, ගන්නා ආහාර වලින් වැඩීම පලදව, ඉක්මණින් වැඩීම, හොඳ මස් සහ ලොම් නිෂ්පාදනය කිරීම, හොඳින් පැටවුන් දැමීම සිදු කරනවා. ඒ විතරක් නොමෙයි, දැන් ඕලන්දයේ බැටළු කර්මාන්ත මූළමනින්ම රඳා පවතින ටෙක්සෙල් බැටළුවන් මතයි.

## ලෝකයට ම 'පාන්' සපයන ඇමෙරිකාවේ ගොවිපලවල්

ලෝක වෙළඳ පොලේ 'පාන්' තැනීමට ගන්නා තිරිඟු පිටි මිළ වැඩිවෙලා. ඊට නොයෙක් හේතු දක්වනවා. ඒ කෙසේ වුනත්, ලෝකයේ ආහාර අහේනියක් ඇති වුන හැම විට ම පිහිට වන්නේ 'ඇමරිකන් පිටි'යි.

ඇමරිකාවේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර දශලක්ෂ 1,085 ක් පමණ වේ. මේ ප්‍රමාණය ගොවිපලවල් 2,786,000 කට අයත් වෙනවා. 1976 ගොවිපලක සාමාන්‍ය ප්‍රමාණය අක්කර 389 යි. බොහෝ ගොවිපලවල කෙරෙන තිරිඟු, ඉරිඟු, සත්ව පාලනය ඇතුලත් වන ගොවිතැනක්.

1976 වර්ෂයේ ඇමරිකා එක්සත් ජනපදයේ මුළු තිරිඟු නිෂ්පාදනය බුසල් දශ ලක්ෂ 2134 ක් වුනා. මෙයින් බාගයකට වඩා එනම්, බුසල් දශ ලක්ෂ 1138 ක් පිටරටවල අවශ්‍යතාවයන් පිරිමැසීමට විකුණුවා. ලෝක වෙළඳ පොලේ අලෙවි කරන තිරිඟු වලින් සියයට 40.4 ක් ම මේ රටේ නිපද වන තිරිඟුය.